# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2451/18 – 2025 අගෝස්තු මස 27 වැනි බදාදා – 2025.08.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 වූ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**අනුර කරුණාතිලක** (පා.ම),
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය.

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය අදියර" - II,
බත්තරමුල්ල,
2025 අගෝස්තු මස 25 වන දින.

උපලේඛන 1

**මැදවච්චිය නාගරික ප්‍රදේශය පුළුල් කිරීම**

**1 වන තීරුව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අංක: 1517/14 හා 2007.10.03 දින දරන උතුරු මැද පළාතේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටියා වූ ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක: 58 ඉසෙන්බැස්සගල, අංක: 59 ඇකිරිකන්ද. අංක: 61 දුම්රිය නගරය, අංක: 66 කටුවෙල, අංක:67 මැදවච්චිය බටහිර, අංක :68 මැදවච්චිය නැගෙනහිර යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලට අමතරව අංක: 46 මහකුඹුක් ගෝල්ලෑව, අංක: 69 කනදරා දිවුල්වැව, අංක: 78 සංගිලිකනදරාව, අංක: 65 වල්පොල, අංක: 60 කඩවත්ගම. අංක :47 පුනෑව යන ග්‍රාම නිලධාරි කොට්ඨාස අයත්ව දෙවන තීරුවේ විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

**11 වන තීරුව**

*උතුරට :*

අංක: 51 කුඩාකුඹුක්ගොල්ලෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම සහ අංක: 48 අනේකට්ටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන (1) ආරම්භක ලක්ෂ්‍යයේ සිට අංක: 48 අනේ කට්ටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම් ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කර අංක: 42 කිඩාවරක්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය (2) දක්වාද, එතැන් සිට අංක: 42 කිඩාවරක්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු සහ නැගෙනහිර දිශානුගතව උතුරු දුම්රිය මාර්ගය හා නුවර යාපනය මාර්ගය ඡේදනය කරමින් ගමන් කර එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කර අංක: 43 ප්‍රබෝධාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය (3) තෙක්ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන් කර අංක: 45 පරණ හල්මිල්ලෑව දරණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන වන ලක්ෂ්‍යය (4) දක්වාද, එතැන් සිට අංක: 45 පරණ හල්මිල්ලෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දිශාවට ගමන් කර අංක: 52 කඩවත් රඹෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂය (5) දක්වා ද වේ.

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ (5) සිට අංක : 52 කඩවත් රඹෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ දකුණු දිශානුගතව ගමන් කර අංක: 57 මහදිවුල්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය (6) දක්වාද, එතැන් සිට නාගරික සංවර්ධන අධිකාරිය මගින් අංක: 1517/14 හා 2007.10.03 දින *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත මායිම් හමුවන ලක්ෂ්‍යය (7) දක්වා ගමන් කර, එතැන් සිට අංක :70 හැලඹගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ මැදවච්චිය. හොරොව් පොතාන මාර්ගය ඡේදනය කරමින්, දකුණු සහ නැගෙනහිර දිශානුගතව ගමන් කර එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිරට දිශානුගතව ගමන් කර අංක: 72 කිරිගල්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය (8) දක්වාද, එතැන්සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ගමන් කර අංක : 77 ලිඳ වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය (9) දක්වා, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ගමන් කර රඹෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය (10) දක්වාද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ (10) සිට රඹෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උතුරු මායිම ඔස්සේ බටහිරට දිශානුගතව ගමන් කර නාගරික සංවර්ධන අධිකාරිය මගින් අංක:1517/14 හා 2007.10.03 දින *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත මායිම් හමුවන ලක්ෂ්‍යය (11) දක්වා ද, එතැන් සිට එකී මායිම ඔස්සේ ගමන් කර අංක:64 විරල් මුරිප්පුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය (12) දක්වාද

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ (12) සිට අංක: 1517/14 හා 2007.10.03 දින *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත මායිම ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කර, අංක: 64 විරල් මුරිප්පුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (13) නැගෙනහිර මායිම් ඔස්සේ සහ උතුරු මායිම ඔස්සේ ඊශාන සහ වයඹ දිශානුගතව උතුරු දුම්රිය මාර්ගය ඡේදනය කරමින් ගමන් කර. අංක: 62 පුල් එළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන (14) ලක්ෂ්‍යය තෙක්ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ දිශානුගතව ගමන් කර අංක: 51 කුඩා කුඹුක්ගොල්ලෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම (15) හමුවන තෙක්ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගමන් කර ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

E0G 08-0280

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.